**නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය - 2016**

**-------------------------------------------------------------**

නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ වැඩිදියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

-----------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික ගෙවීම් රු.171,000 ක් වුවත් මෙහෙයුම් කටයුතු වලින් වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී එය රු.201,000 ක් ලෙස දක්වා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ දී ප්‍රාග්ධන ප්‍රදාන ලෙස භාණ්ඩාගාරයෙන් රු.79,043,000 ක් ලැබී තිබුණ ද මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී එය රු.85,433,000 ක් ලෙස දක්වා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

ආදායම් ගිණුම්ගත කිරීමේදී උපචිත පදනම අනුගමනය කරන බව ආයතනයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණ ද, නිලධාරීන් වෙත බෙදාහැරීමට යටත්වන ආදායම් ව්‍යාපෘති 19කට අදාළව 2014, 2015 හා 2016 වර්ෂවලදී ඉන්වොයිස් කරන ලද එකතුව රු.1,504,800 ක ආදායම් අදාළ වර්ෂවල කාර්යසාධන ප්‍රකාශනවලට ඇතුළත් කිරීම වෙනුවට, විලම්භිත ආදායම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දී අපහරණය කරන ලද රු.453,295 ක් පිරිවැය වූ කාර්යාල උපකරණවල සමුච්චිත ක්ෂය වෙන්කිරීම රු.91,637 ක් වැඩියෙන් ගණනය කිරීම හේතුවෙන් භාණ්ඩ විකිණීමේ ලාභය රු.91,637 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සඳහා සේවා සැපයීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු රු.1,035,657 ක කුලී ආදායම ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) තේ කොළ වර්ණ ශ්‍රේණිගත කිරීමේ යන්ත්‍රය නිපදවීමේ පර්යේෂණ ව්‍යාපෘතිය වෙනුවෙන් 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී රු.4,209,066 ක වියදමක් දරා තිබුණු අතර ඉන් රු.1,102,586 ක් පර්යේෂණ වියදම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට කෙරීගෙනයන වැඩ ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා තිබුණි.

(ඇ) පර්යේෂණ ව්‍යාපෘතිවලට අදාළ වැඩමුලු හා සම්මන්ත්‍රණ පැවැත්වීම වෙනුවෙන් දරන ලද රු.9,234,889 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ පර්යේෂණ හා සංවර්ධන වියදම් ලෙස හා ප්‍රාග්ධන ප්‍රදාන උපයෝජනය කිරීම ආදායමක් ලෙස දැක්වීම වෙනුවට, එම මුදල හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ ප්‍රාග්ධන ප්‍රදාන වලින් අඩුකර දක්වා තිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ**

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති සහ පාඨමාලා පැවැත්වීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු. 8,986,777ක ශේෂයෙන් රු. 4,178,088 ක්, 2017 නොවැම්බර් මාසය වන විටත් අයකරගෙන නොතිබුණු අතර ඉන් වර්ෂ 2ට වැඩි ශේෂයන්හි එකතුව රු. 1,586,990 ක් විය.

(ආ) පුද්ගලයන් 3 දෙනෙකුගෙන් හා බාහිර ආයතන 4 කින් අයවිය යුතු වසර 3 ඉක්මවා තිබූ රු.222,270 ක ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) බාහිර පාර්ශවයන් වෙත ගෙවිය යුතු වසර 3 කට වැඩි ශේෂයන්ගේ එකතුව රු.1,877,338 ක් වූ අතර මෙම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2014 හා 2015 වර්ෂවලදී ලබාදී තිබූ රු.195,150 ක් වටිනා අත්තිකාරම් 4 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද පියවා නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

------------------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| (i) | VII පරිච්ඡේදයේ 10 වගන්තිය හා 2013 ඔක්තෝබර් 07 දිනැති අංක 21/2013 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 (අ) සහ (ඇ) | අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී විසින් නිවාඩු දිනවල වැඩ කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී නිවාඩු දින 22 ක් වෙනුවෙන් නිවාඩු දින වැටුප් ලෙස රු.81,620 ක් ලබාගෙන තිබුණි. |
| (ii) | VII පරිච්ඡේදයේ 12.5.4 වගන්තිය | වැඩ බැලීමේ තනතුරක් සඳහා ගෙවීම් කිරීමේදී වැඩබලන තනතුරට අයත් ආරම්භක වැටුපෙන් සියයට 25 ක් පමණක් ගෙවිය යුතුය. එහෙත් නිලධාරීන් දෙදෙනෙකුට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරෙහි වැඩ බැලීම වෙනුවෙන් දීමනා ගෙවීම වෙනුවට, 2015 මැයි සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ප්‍රවාහන හා ඉන්ධන දීමනා ලෙස රු.2,778,116 ක් ගෙවීම හේතුවෙන් අදාළ නිලධාරීන්ට වැඩබැලීමේ දීමනාව ලෙස හිමි දීමනාවට වඩා රු.2,214,602 ක් වැඩිපුර ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2000 ජනවාරි 19 දිනැති අංක 380 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛයෙන් ආවරණය නොවන බැටරි පරීක්ෂාව, RCCB පරීක්ෂාව යන ව්‍යාපෘති තුළින් ලැබෙන ආදායමෙහි අතිරික්තය ඊට සම්බන්ධ ඍජු හා චක්‍ර කාර්ය මණ්ඩලය වෙත බෙදා හැරීමට කටයුතු නොකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී එම ආදායමෙන් රු.831,897 ක් කාර්ය මණ්ඩලය වෙත බෙදා හැර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.15,287,030 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.9,511,887 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.24,798,917 ක පිරිහීමක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ප්‍රදාන ලැබීම් රු.18,622,000 කින් අඩුවීම හා මෙහෙයුම් වියදම් රු.5,830,487 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී රු.18,679,669 ක් වූ අතිරික්තය 2015 වර්ෂය වනවිට රු.9,511,887 ක් දක්වා අඩු වී තිබුණු අතර 2016 වර්ෂයේදී රු.15,287,030 ක ඌනතාවයක් ඇතිවී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ස්ථාවර වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු.77,249,669 ක් වූ ආයතනයේ දායකත්වය 2016 වර්ෂය අවසානයට රු.90,296,226 ක් දක්වා වර්ධනය වී තිබුණද, 2015 වර්ෂයට සාපේක්ෂව සියයට 10 කින් අඩු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 4.1 කාර්යසාධනය

------------------

1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ වැඩිදියුණු කිරීමේ පනතේ 22 වන ඡේදය ප්‍රකාරව, ආයතනයේ කාර්යභාරය වනුයේ නවීන තාක්ෂණය හඳුන්වාදීම වේගවත් කිරීම සඳහා නවීන තාක්ෂණයන් යොදාගැනීම සඳහා පර්යේෂණ හා සංවර්ධන කටයුතු ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ව්‍යාපාරවලට පර්යේෂණ හා සංවර්ධන සහාය සැලසීම සහ රාජ්‍ය හා පෞද්ගලික අංශය මගින් සිදුකරන කාර්යයන් වලදී නවීන තාක්ෂණය පිළිබඳව පුද්ගලයන් පුහුණු කිරීම හා අනාගත අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය කිරීම වුවත් ආයතනයේ කාර්යසාධනය පිළිබඳ පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) තේ කොළ වර්ණ ශ්‍රේණිගත කිරීමේ යන්ත්‍රය නිපදවීමේ ව්‍යාපෘතිය

--------------------------------------------------------------------------

(i) තේ කොළ වර්ණ ශ්‍රේණිගත කිරීම සඳහා අඩු පිරිවැය යන්ත්‍රයක් නිපදවීමේ පර්යේෂණ ව්‍යාපෘතියක් 2012 වර්ෂයේ ආරම්භකර තිබුණද, එම ව්‍යාපෘතිය නිමකල යුතු කාලය, එක් එක් වර්ෂයේ සිදු කළ යුතු කාර්යභාරය ආදිය පිළිබඳ සැලැස්මක් සකස්කර නොතිබුණු අතර 2016 වර්ෂය අවසාන වනවිටත් යන්ත්‍රය නිපදවීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඒ වෙනුවෙන් දරන ලද පිරිවැය රු.4,209,066 ක් විය.

(ii) මෙම පර්යේෂණ ව්‍යාපෘතිය තුළින් මෙරට තේ කර්මාන්තය සඳහා නවීන තාක්ෂණය හඳුන්වාදීමට බලාපොරොත්තුවන ආකාරය, දැනට වෙළඳ පොළෙහි පවතින යන්ත්‍රවලට වඩා මෙමගින් බලාපොරොත්තුවන විශේෂිත ගුණාංග, අපේක්ෂිත වෙළඳපොළ, අපේක්ෂිත පිරිවැය හා තේ කර්මාන්තයේ අභිවෘද්ධිය උදෙසා දායක වන ආකාරය කෙසේද යන්න දැක්වෙන පරිදි ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රථමයෙන් සකස් කර නොතිබුණි.

(iii) විද්‍යා හා තාක්ෂණ වැඩිදියුණු කිරීමේ පනත ප්‍රකාරව නවීන තාක්ෂණය යන්නට ඉලෙක්ට්‍රොනික විද්‍යාවද අයත් වන අතර ආයතනයේ ඉලෙක්ට්‍රොනික විද්‍යා අංශයක්ද ස්ථාපිත කර තිබිණි. එහෙත් ඉලෙක්ට්‍රොනික වැඩිදියුණු කිරීම් සඳහා අවශ්‍ය විශේෂඥ ඥානය ආයතනය සතුව නොමැති බව සඳහන් කරමින් ඉහත ව්‍යාපෘතිය තවදුරටත් කරගෙන යෑම සඳහා 2016 මාර්තු මාසයේදී පෞද්ගලික ආයතනයක් සමග රු.8,000,000 ක මුදලකට ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම ප්‍රකාරව 2017 අගෝස්තු වන විට එහි IV වන අදියරෙහි වැඩ අවසන් විය යුතු වුවත්, I අදියරෙහි කටයුතු පමණක් අවසන් කර ඇති බව භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

(ආ) පුරාවිද්‍යා ගවේශණ සහ කැනීම් සඳහා නවීන තාක්ෂණය යොදා ගැනීම.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙනුවෙන් පුරාවිද්‍යා ගවේශණ හා කැනීම් කටයුතු සඳහා ඡායා පිටපත් ලබාගැනීමේ අරමුණින් වටිනාකම රු.10,564,677 ක් වූ නියමුවන් රහිත යානයක් 2016 අගෝස්තු මාසයේදී මිලදී ගෙන තිබුණි. යානය මිලදී ගැනීමට පෙර එය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රු.110,322 ක වියදමක් දරා නිළධාරීන් දෙදෙනෙකුට විදේශීය පුහුණුවක්ද ලබා දී තිබියදී නොවැම්බර් 30 දින ප්‍රථමවරට යානය ගුවන් ගත කල අවස්ථාවේදී යානය හානියට පත්වී තිබුණි. නිෂ්පාදිත රටට යවා යානය අළුත්වැඩියා කර තිබුණද 2017 ඔක්තෝබර් 30 වන විටත් එය ක්‍රියාත්මක කල හැකි තත්ත්වයේ නොමැති බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයට අයත් විදුලි සංදේශ කුලුන, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට කුලියට දීමට අදාළව ආයතනය විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සමග 2013 වර්ෂයේ දී එළඹි බදු ගිවිසුම 2015 ජනවාරි 31 දින අවසන් වී තිබුණි. එහෙත් අදාල බදු ගිවිසුම අලුත් කිරීමකින් තොරව 2015 පෙබරවාරි මාසයේ සිට ජුලි මාසය දක්වා භාවිතා කර තිබූ අතර ඒ වෙනුවෙන් ආයතනයට ලැබිය යුතු රු. 638,134 ක කුලිය අයවී නොතිබුණි.
තවද, 2015 අගෝස්තු 01 දින සිට සිට 2017 ජූලි 31 දිනෙන් අවසන් වර්ෂ 02ක කාලය සඳහා ගිවිසුම් අත්සන් කර තිබුණද අදාල කාලය වෙනුවෙන් ලැබිය යුතු රු. 2,079,768 ක කුලියද, 2017 නොවැම්බර් 30 වන විටත් අයකරගෙන නොතිබුණි.

(ආ) පෘථිවි නිරීක්ෂණ දත්ත ලබාගැනීම හා බෙදාහැරීම පිළිබඳ ජාතික මධ්‍යස්ථානය

රටේ සංවර්ධනය සඳහා අභ්‍යවකාශ තාක්ෂණය යොදාගැනීම දිරිගැන්වීමේ අරමුණින් චීන රජයේ සහභාගිත්වයෙන් චන්ද්‍රිකා මධ්‍යස්ථානයක් පිහිටුවීමේ ව්‍යාපෘතියක් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීමකින් තොරව ආරම්භ කර තිබුණි. චීන නියෝජිත ආයතනය සමග වූ අවබෝධතා ගිවිසුම ප්‍රකාරව මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා සුදුසු භූමියක් තෝරාගැනීමේදී දෙපාර්ශවයම සහභාගී විය යුතු වුවත්, චීන නියෝජිත ආයතනයේ සහභාගීත්වයකින් තොරව ආයතනයේ අභිමතය පරිදි භූමියක් තෝරගෙන තිබුණි. එහෙත් චීන නියෝජිත ආයතනය

විසින් පසුව සිදුකල නිරීක්ෂණ චාරිකා වලදී එම භූමිය ව්‍යාපෘතිය සඳහා සුදුසු නොවන බැවින් වෙනත් භූමියක් සොයාගැනීමට කටයුතු කළ යුතු බව සඳහන් කර තිබුණි. එහෙත්, ආයතනය විසින් එම ඉඩම වටා වැටක් ඉදිකිරීම වෙනුවෙන් 2016 දෙසැම්බර් 16 දින රු.3,545,744 ක මුදලක් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණ ද විගණන දිනය වූ 2017 නොවැම්බර් මාසය වන විටත් අදාළ වැට ඉදිකර නොතිබුණු බැවින් එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයේ සිට උපයෝජනයකින් තොරව පවතින පිරිවැය රු. 4,091,099 ක් වූ තොග අතුරින් භාවිතයට ගත නොහැකි තොග හා සෙමෙන් චලනය වන තොග හඳුනාගෙන අපහරණය කිරීමට හෝ මූල්‍ය ප්‍රකාශනවල වෙන්කිරීම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී සිදුවූ වාහන අනතුරකින් වූ රු.50,063 ක අලාභය රියදුරුගෙන් අයකල යුතු බවට මූලික විමර්ෂණයෙන් නිර්දේශ කර තිබුණද විගණන දිනය වූ 2017 අගෝස්තු වන විටත් එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 177 ක් වුවද, තත්‍ය කාර්ය මණ්ඩලය 91ක් වූයෙන් තනතුරු 86 ක පුරප්පාඩු පැවතිණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට පැවති තනතුරු 29 ක පුරප්පාඩු 96 අතුරින් තනතුරු 9 ක පුරප්පාඩු පිරවීම සඳහා පමණක් පුවත්පත් දැන්වීම් පලකර තිබුණු අතර ඉන් තනතුරු 2 ක පුරප්පාඩු 8 ක් සඳහා පමණක් බඳවා ගැනීම් සිදුකර තිබුණි.

(ආ) පර්යේෂණ හා සංවර්ධන කටයුතු ඉටුකිරීමේ අරමුණින් ක්‍රියාත්මක මෙම ආයතනය ක්ෂුද්‍ර ඉලෙක්ට්‍රොනික, විදුලි සංදේශ, තොරතුරු තාක්ෂණ, අභ්‍යවකාශ තාක්ෂණ, රොබෝ විද්‍යාව පිළිබඳව සහ නවීන තාක්ෂණ විෂය පිළිබඳ හා වෙනත් අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ ප්‍රමුඛ ආයතනයද වේ. එම ක්ෂේත්‍රයන්ට ඍජුවම සම්බන්ධවන නිලධාරීන්ගෙන් සමන්විත තනතුරු 34 ක පුරප්පාඩු 70 ක් පැවතීම ආයතනයෙන් අපේක්ෂිත අරමුණු කරා ළඟා වීමට බලපෑ හැකි බැවින් පුරප්පාඩු සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් පවතින ගැටලු සමාලෝචනය කර එම ගැටළු විසඳා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තිය ප්‍රකාරව වැඩ බැලීමේ පත්කිරීමක් කල යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වන අතර තනතුරට පූර්ණ කාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත්වීමක් නොපමාව සිදුකල යුතුය. එහෙත් 2013 හා 2015 වර්ෂවල සිට වැඩ බැලීමේ පත්වීම් සිදුකර තිබූ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 4 ක පුරප්පාඩු පිරවීම සඳහා 2017 මැයි 30 දක්වාම කටයුතු කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

(අ) 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් කර තිබූ කාර්යයන් 77 න් කාර්යයන් 25 ක් හැර අනෙක් එක් එක් කාර්යය සඳහා වන ඇස්තමේන්තු මුදල කොපමණද යන්න දක්වා නොතිබුණු අතර වර්ෂ අවසාන කාර්යසාධන ඇගයීමේදීද සත්‍ය වශයෙන් වැයවූ මුදල කොපමණද යන්න කිසිදු ව්‍යාපෘතියක් සඳහා දක්වා නොතිබුණි.

(ආ) එක් එක් ව්‍යාපෘතියෙන් වර්ෂය තුළදී නිම කිරීමට අපේක්ෂිත ප්‍රමාණය හා ප්‍රගතිය සමාලෝචනය කිරීමේදී භෞතික ප්‍රගතිය ප්‍රතිශතාත්මක ලෙස ඇගයීම සිදුකිරීම තුළින් පවත්නා වර්ෂයේ ආයතනයේ මූල්‍ය පිරිවැයට සාපේක්ෂව ප්‍රගතිය ඇගයීමටත් ඊළඟ වර්ෂයේ ක්‍රියාකාරකම් මනාව සැලසුම් කිරීමටත් පහසු වුවද ක්‍රියාකාරී සැලැස්මෙහි සහ ප්‍රගති වාර්තාවල එසේ දක්වා නොතිබුණි.

## 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් කර තිබූ ඇස්තමේන්තුගත වටිනාකම රු.24,064,881 ක් වූ භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනයන් 60 ක් වර්ෂය තුළ ඉටුකර නොතිබුණි. තවද, 2015 වර්ෂයේදී මිළදී ගැනීමට නොහැකි වීම හේතුවෙන් 2016 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර තිබූ ඇස්තමේන්තුගත වටිනාකම රු.20,910,419 ක් වූ ප්‍රසම්පාදනයන් 14 ක් 2016 වර්ෂයේදී ද නිම කර නොතිබුණි. මේ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම ලෙස සැලසුම් කර තිබුණේද යන්න විගණනයේදී ගැටළු සහගත විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපති වෙත යොමු කරන ලදී. පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | මානව සම්පත් කළමනාකරණය | (i) නිවාඩු දිනවල වැඩ කිරීමට පෙර පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත් වැඩකල දිනට පසුව අනුමැතිය ලබාගැනීම. |
| | | (ii) පැමිණීමේ සහ පිටවීමේ ලේඛනය අනුව අදාළ දිනයේ පැමිණීම හා පිටවීම නිවැරදි බවට බලයලත් නිලධාරියෙකු විසින් සහතික නොකිරීම. |
| (ආ) | මූල්‍ය පාලනය | (i) නිවාඩු දිනවල වැඩකිරීම වෙනුවෙන් දීමනා ගෙවීමේදී වවුචර්වල "ගෙවන ලදී" යනුවෙන් සටහන් කර නැවත ගෙවීමක් සිදු නොවන බව තහවුරු කර නොගැනීම. |
| | | (ii) නිවාඩු දින වැඩ කිරීම වෙනුවෙන් දීමනා ඉල්ලුම් කිරීමේදී නියමිත ආකෘති පත්‍රය භාවිතා නොකිරීම. |
| (ඇ) | මෙහෙයුම් පාලනය | (i) විදේශ ගමන් පිළිබඳ ආරාධනා පත්‍රය, අයදුම්පත්‍රය, අනුමැතිය සඳහන් ලිපි ආදිය සහිතව සම්පූර්ණකරන ලද ලිපිගොනු පවත්වා නොගැනීම. |
| | | (ii) නැවත සේවයට වාර්තා කල බව දැන්වීමේ ලිපියක් විදේශ ගමන් ලිපිගොනුවේ හෝ පෞද්ගලික ලිපිගොනුවෙහි නොවීම. |